# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.28 පැය 0535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1954/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - මැදවච්චිය පොලිස් වසම.**

මැදවච්චිය පොලිස් වසමේ ඉසින්බැස්සගම ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට 2025.10.27 වන දින උදෑසන කාලයේ මැදවච්චිය පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 81 ක් වූ ඉසින්බැස්සගම, මැදවච්චිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම මරණකාරිය කථන ආබාධයක් සහිත තම පුත්‍රයා සමඟ නිවසේ පදිංචිව සිට ඇති අතර 2025.10.26 වන දින රාත්‍රී කාලයේදි පුත්‍රයා විසින් පොරවකින් හිසට පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදු කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

ඝාතනයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මස්කෙළිය පොලිස් ස්ථානය.**

2025.10.27 වන දින දහවල් කාලයේදී මස්කෙළිය පොලිස් වසමේ බ්‍රවුන්ස්වික් වත්ත ප්‍රදේශයේදී මස්කෙළිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු මැණික් ගැරීමට යොදාගත් උපකරණ ද සමග අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 44 ක් වන බ්‍රවුන්ස්වික් වත්ත, මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මස්කෙළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - මාතර පොලිස් වසම.**

2025.10.27 වන දින උදෑසන කාලයේ මාතර පොලිස් වසමේ මාතර ගාල්ල ප්‍රධාන මාර්ගයේ රෝහල අසල බස් නැවතුම ආසන්නයේදී මාතර දෙසට ගමන් කල ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථයක් මාර්ගයේ වම්පසින් පාපැදියක් තල්ලුකරගෙන යමින් සිටි පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ එම පුද්ගලයා මාතර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 77 ක් වූ මැදවත්ත, මාතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාරදී ඇති අතර මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - සන්දිවේලි පොලිස් වසම.**

2025.10.27 වන දින සවස් කාලයේ සන්දිවේලි පොලිස් වසමේ මඩකලපුව ත්‍රිකුණාමලය මාර්ගයේ සන්දිවේලි පොලිස් ස්ථානය ආසන්නයේදී මඩකලපුව දෙසට ධාවනය වූ යතුරු පැදියක් ත්‍රිරෝද රථයකට ඉස්සර කිරීමට යාමේදී පැදිකරුට යතුරු පැදිය පාලනය කරගත නොහැකිව පෙරළිගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු මඩකලපුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ කිරාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මඩකලපුව රෝහලේ මෘත ශරීරාගරයේ තැන්පත් කර ඇති අතර සන්දිවේලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**